වඩාත් යහපත් සමාජ චින්තනයක ප්‍රවර්ධනය සඳහා, මාධ්‍ය මගින් සමාජයට එක් කරනා භාෂාවද යහපත් විය යුතු බව Ethics Eye අපි මින් පෙරද පෙන්වා දී ඇත්තෙමු. එයට එක් උදාහරණයක් ලෙස "මස්වැද්දා" වැනි යෙදුම් දැකිය හැක. මස් වැද්දා යන යෙදුම, පුරාණයේ පටන් සිංහල භාෂාවේ භාවිතා වී ඇති බව සැබවි. කෙසේ නමුත්, "තුවක්කුවක් අටවා හිමිනමට මරු කැඳවූ මස්වැද්දා රිමාන්ඩ්" යන සිරස්තලයේත් (ජූනි 16, 2022), "නාඋයන වන අරණේ හිමිනමට මරු කැඳවූ තුවක්කුව බැන්ද මස්වැද්දා අත්අඩංගුවට" යන ලංකාදීප සිරස්තලයේත් (ජූනි 16, 2022) "මස්වැද්දා" යන්න යෙදී ඇත්තේ සැකකරුවෙකුව නිෂේධනාත්මකව ලේබල්ගත කරනා අයුරකින් නොවේදැයි පාඨක අප විමසිය යුතුයි.

මේ අතරම, මෙම පුවතම වාර්තා කරනා මව්බිම සිරස්තලය එය දක්වන්නේ "පිඩුසිඟා වැඩි භික්ෂුවට වෙඩි වැදීමේ සිද්ධියේ බඳින තුවක්කුව කැලයේ ඇටවූ දඩයක්කරු අත්අඩංගුවේ" යනුවෙනි.

ඒ අනුව,

1) සැකකරුවෙකුව නිෂේධනාත්මකව ලේබල්ගත කරමින්, "මස්වැද්දා" වැනි යෙදුම් මාධ්‍ය තුළ භාවිතා වීම කෙතරම් යෝග්‍ය ද?

2) "මස්වැද්දා" යන යෙදුම වෙනුවට 'දඩයක්කරු' වැනි යෙදුමක් වඩාත් යෝග්‍ය නොවන්නේද?

සැකකරුවන් ලේබල් නොකරමු!